# භූගෝල විද්‍යාව

## 10 ශ්‍රේණිය

## ලෝකයේ ප්‍රධාන කෘෂිකාර්මික භූමි පරිභෝග වර්ග

එච්. වී. කේ. එන්. ජයවර්ධන
කෑ/ දෙහි/ මානියම්ගම මහා විද්‍යාලය

## නිපුණතාව

භෞතික හා මානුෂ ක්‍රියාවලින්ගේ අන්තර් ක්‍රියා භෞතික හා මානුෂ පරිසරය කෙරෙහි බලපාන ආකාරය පිළිබඳ අවබෝධයෙන් කටයුතු කරයි

## නිපුණතා මට්ටම

ලෝකයේ ප්‍රධාන කෘෂිකාර්මික භූමි පරිභෝග වර්ගවල ව්‍යාප්තිය හා විශේෂිත ලක්ෂණ පැහැදිලි කරයි.

## ඉගෙනුම් පල

- ලෝකයේ ප්‍රධාන කෘෂි කාර්මික භූමි පරිභෝග වර්ග නම් කරයි.
- වී හා තිරිඟු වගා ව්‍යාප්ති ප්‍රදේශ ලෝක ආකෘති සිතියමක ළකුණු කර ඉදිරිපත් කරයි.
- වී හා තිරිඟු වගාවට සුවිශේෂ වූ ලක්ෂණ පැහැදිලි කරයි.
- වතු කෘෂිකර්මාන්තයේ මූලික ලක්ෂණ පැහැදිලි කරයි.
- ලෝකයේ තේ හා රබර් වගාවේ විශේෂිත ලක්ෂණ විස්තර කරයි.
- තේ හා රබර්වල ව්‍යාප්ති ප්‍රදේශ ලෝක සිතියමක් ඇසුරින් පැහැදිලි කරයි.
- ව්‍යාපාරික කිරිපට්ටි පාලනය ව්‍යාප්ති ප්‍රදේශ ලෝක සිතියමක ළකුණු කර නම් කරයි.

# ලෝකයේ ප්‍රධාන කෘෂිකාර්මික භූමි පරිභෝග වර්ග


- කෘෂිකර්මාන්තය සඳහා භූමිය යොදා ගැනීම කෘෂිකාර්මික භූමි පරිභෝගය ලෙස හැඳින් වේ.
- මෙහි ප්‍රධානම ලක්ෂණය වන්නේ **පාරිභෝගික හා ව්‍යාපාරික** වශයෙන් කෘෂි භූමි පරිභෝගය වෙන්ව පැවතීමයි.
- කෘෂිකර්මාන්තයට ඉතා දීර්ඝ ඉතිහාසයක් ඇති අතර නිරන්තරයෙන් විවිධ වෙනස්කම්වලට ලක් වෙමින් පවතී. නමුත්, කිසි විට එහි වටිනාකම අඩු වී නොමැත.

## වී වගාව

- ලෝකයේ **වී** වගා කරන ප්‍රදේශ දෙකොටසක් හඳුනා ගත හැකිය.
    1. ආසියාවේ වී වගා කරන ප්‍රදේශ
    2. ආසියාවෙන් පිටත වී වගා කරන ප්‍රදේශ
- ආසියාතික රටවල බොහෝවිට ශ්‍රම සූක්ෂම වගාවක් වන වී වගාව ආසියාවෙන් බැහැර ප්‍රදේශවල විශාල වශයෙන් යන්ත්‍ර සූත්‍ර භාවිතයෙන් සිදු  කෙරේ.








ක්‍රියාකාරකම

01. කෘෂිකාර්මික භූමි පරිභෝගය යනු කුමක්ද?

02. විවිධ වෙනස්කම්වලට ලක් වූවද කෘෂිකමාන්තයේ වටිනාකම අඩු නොවීමට හේතු මොනවාද?

03. ආසියානු ප්‍රදේශයට වී වගාවෙහි ඇති වැදගත්කම දක්වා මෙම ප්‍රදේශයන්හි වී වගාව හා සම්බන්ධ විශේෂ ලක්ෂණයක් ලියන්න.

04. ලෝකයේ වී වගා කරන ප්‍රදේශ දෙක ලියා උදාහරණ තුන බැගින් ලියන්න.

05. වී වගාවේ ව්‍යාප්තිය සඳහා බලපාන සාධක ලියන්න.


06. හෙල්මළු ක්‍රමය යනු කුමක්ද?

07. ලෝකයේ වී වගා කරන රටවල් ලෝක ආකෘති සිතියමක ළකුණු කර නම් කරන්න.

## තිරිඟු වගාව

- ලොව වැඩි වශයෙන් නිෂ්පාදනය හා පරිභෝජනය කරන ධාන්‍ය වර්ගයක් ලෙස **තිරිඟු** සුවිශේෂී වේ.






ක්‍රියාකාරකම

01. ලෝකයේ තිරිඟු වගාව ආශ්‍රිත විශේෂ ලක්ෂණ තුනක් ලියන්න.

02. නොරීන් - 10 යනු කුමක්ද?

03. තිරිඟු වගාවේ ව්‍යාප්තිය සඳහා බලපාන සාධක ලියන්න.

04. ලෝකයේ තිරිඟු වගාවේ දියුණුවට බලපා ඇති සාධක තුනක් ලියා එකක් පැහැදිලි කරන්න.

05. ලෝකයේ තිරිඟු වගා කරන රටවල් ලෝක ආකෘති සිතියමක ළකුණු කර නම් කරන්න.

## වතු කෘෂිකර්මය හා තේ වගාව





- මනා සංවිධානයකින් හා කළමනාකාරීත්වයකින් යුක්තව පුහුණු ශ්‍රමය භාවිත කරමින් අපනයනය මුල් කරගෙන විශාල වතුවල සිදුකරන භෝග වගාව වතු කෘෂිකර්මාන්තය නම් වේ.
- වර්තමාන ලෝකයේ සෑම රටකම පාහේ බහුලව භාවිත වන පානයක් වන තේ, චීන ජාතිකයින් විසින් සොයා ගැනුනකි.
- යටත්විජිත සමයේ බටහිර ජාතීන් විසින් ලෝකයේ බොහෝ රටවලට වතු වගාවක් ලෙස තේ ව්‍යාප්ත කරනු ලැබිනි.

**තේ වගාව**

අවශ්‍ය සාධක

* 15°C - 27°C අතර උෂ්ණත්වය
* 1900 mm - 5460 mm වාර්ෂික වර්ෂාපතනය
* ලෝම ලැටරයිට් පස
* මඳ බෑවුම් සහිත ප්‍රදේශ
* පුහුණු ශ්‍රමය

වගා කරන රටවල්

චීනය
ඉන්දියාව
කෙන්යාව
ශ්‍රී ලංකාව
තුර්කිය

ලක්ෂණ

* දිගු කාලයක් අස්වැන්න ලබා දෙන භෝගයක් වීම
* විශාල වතු හා කුඩා වතු ලෙස ව්‍යාප්තව පැවතීම
* බීජ තේවලට වඩා රිකිලි තේ ගස ප්‍රචලිත වීම
* විවිධ රසයෙන් වෙළඳපලට ඉදිරිපත් කිරීම

ක්‍රියාකාරකම

01. වතු කෘෂිකර්මය යන්න පැහැදිලි කරන්න.

02. වතු කෘෂිකර්මයේ විශේෂ ලක්ෂණ පහක් ලියන්න.

03. ලෝකයේ තේ වගාව සඳහා ප්‍රමුඛස්ථානයක් හිමිකරගෙන ඇති කලාපය නම් කරන්න.

04. තේ වගාවේ ව්‍යාප්තිය සඳහා අවශ්‍ය සාධක ලියන්න.

05. තේ සඳහා වෙළඳපල භාවිතයේ දී නිෂ්පාදිත රටවල් අනුගමනය කරන උපාය මාර්ග මොනවාද?

# රබර් වගාව

- බ්‍රසීලයේ කැලෑ භෝගයක් වූ රබර් පසු කාලීනව වතු වගාවක් ලෙස ව්‍යාප්ත විය. 1890 පමණ වන විට යුරෝපයේ මෝටර් රථ කර්මාන්තය දියුණු වීම නිසා රබර් සඳහා ඉල්ලුම ක්‍රමයෙන් වැඩි විය.





**රබර් වගාව**

අවශ්‍ය සාධක
* 27 $^{\circ}C$ උෂ්ණත්වය
* 2000 mm වාර්ෂික වර්ෂාපතනය
* ලැටරයිට් හෝ කබොක් මිශ්‍ර රතු පස
* පුහුණු ශ්‍රමය

වගා කරන රටවල්
තායිලන්තය
ඉන්දුනීසියාව
මැලේසියාව
වියට්නාමය
ඉන්දියාව
ශ්‍රී ලංකාව

නිෂ්පාදිත ද්‍රව්‍ය
ටයර්
සෙල්ලම් බඩු
සපත්තු
බෑග්.....

ලක්ෂණ
* මෑත කාලීනව නව තාක්ෂණය භාවිතය
* විශාල වතු ලෙස ව්‍යාප්තිය
* ශ්‍රම ශුක්ෂම වගාවක් වීම
*සංවර්ධනය වෙමින් පවතින රටවල ආර්ථිකයට විශාල දායකත්වයක් ලබා දීම
* කෘත්‍රිම රබර්වලින් එල්ලවන තරගය නිසා වෙළඳපල ගැටලු ඇති වීම

ක්‍රියාකාරකම

01. 19වන සියවස අගභාගය වන විට ලෝකයේ රබර් සඳහා ඉල්ලුම වැඩි වීමට හේතුව කුමක්ද?

02. වර්තමාන ලෝකයේ ස්වාභාවික රබර් අවශ්‍යතාව වැඩි වශයෙන් සපුරාලන කලාප නම් කරන්න.

03. රබර් වගාව සඳහා අවශ්‍ය පාරිසරික සාධක හා අනෙකුත් සාධක වෙන වෙනම ලියන්න.

04. වර්තමානයේ ස්වාභාවික රබර් සඳහා වෙළඳපල තුළ මතුව ඇති ගැටලුවක් නම් කරන්න.

05. ලෝකයේ රබර් වගා කරන රටවල් ලෝක ආකෘති සිතියමක ළකුණු කර නම් කරන්න.

## සත්ත්ව පාලනය හා ව්‍යාපාරික කිරිපට්ටි පාලනය





- සත්ත්ව පාලනය ලොව පැරණිම භූමි පරිභෝග ක්‍රමයකි.
- ලෝක ජනතාවගේ ප්‍රෝටීන් අවශ්‍යතාව සපුරාලීම සඳහා කිරි සුවිශේෂී ආහාරයක් ලෙස ප්‍රචලිතය.

**කිරිපට්ටි පාලනය**

අවශ්‍ය සාධක

* තණ බිම්වල ව්‍යාප්තිය
* සිසිල් දේශගුණය
* ජල පහසුව
* නව තාක්ෂණය
* වෙළඳපල

රටවල්

තායිලන්තය
ඉන්දුනීසියාව
මැලේසියාව
වියට්නාමය
ඉන්දියාව
ශ්‍රී ලංකාව

ප්‍රයෝජන

* කිරි ලබා ගැනීම
* ප්‍රෝටීන අවශ්‍යතා සඳහා
* ඓන්ද්‍රීය පොහොර ලබා ගැනීමට

ලක්ෂණ

* සංවර්ධිත රටවල් විසින් පාලනය කිරීම
* දියුණු ශිල්ප ක්‍රම භාවිතය
* දියර කිරි හා කිරි ආශ්‍රිත නිෂ්පාදන සඳහා වෙළඳපල පුළුල් වීම
* චීස්, බටර්, යෝගට්, කිරි පරිභෝජනය වැඩි වීම

ක්‍රියාකාරකම

01. ලොව පැරණිම භූමි පරිභෝග ක්‍රමයක් ලෙස සත්ත්ව පාලනයෙහි වැදගත්කම පැහැදිලි කරන්න.

02. ලෝකයේ සත්ත්ව පාලනය යටතේ ඇති කරන සතුන් නම් කර එම සත්ත්වයින්ගෙන් ලබා ගන්නා ප්‍රයෝජන වෙන වෙනම ලියන්න.

03. වෙළඳපලෙහි දක්නට ඇති කිරි ආශ්‍රිත නිෂ්පාදන ලැයිස්තුවක් සකසන්න.

04. ලෝකයේ කිරිපට්ටි පාලනය වැඩිවශයෙන් ව්‍යාප්තව ඇති දේශගුණික කලාපය නම් කරන්න.

05. ලෝකයේ කිරිපට්ටි පාලනය සම්බන්ධ විශේෂ ලක්ෂණ තුනක් ලියා උදාහරණ සහිතව පැහැදිලි කරන්න.